අමර ජයසේකර

ඕස්ට්‍රේලියාවේ වික්ටෝරියා ප්‍රාන්තය වෙනුවෙන් පූර්ණ බලතල සහිත කොන්සල් ජනරාල් කාර්යාලයක් විවෘත කිරීම සම්බන්ධයෙන් පසුගිය සන්නස පුවත්පතට ඩී බී කුරුප්පු මහතා විසින් ලියන ලද ලිපිය සම්බන්ධව අදහස් දැක්වීමක් කිරීම සුදුසු යයි මට සිතෙයි.

# කොන්සල් කාර්යාලය ශ්‍රී ලාංකික සමාජයේ අවශ්‍යතාවකි




මෙයට වසර දෙකකට තුනකට පමණ පෙර දිනෙක අප මුහුණ දුන් අභාග්‍ය සම්පන්න සිදුවීමක් මගේ මතකයට එයි. සිදුවීමට හුමුණ දුන්නේ මගේ ළඟම හිතවතෙකි. එක්තරා දිනෙක ඔහුට ශ්‍රී ලංකාවෙන් ලද පණිවුඩයකින් කියැවුණේ ඔහුගේ පියා බලවත් ලෙස රෝගීව රෝහලට ඇතුල් කළ බවය. සිය පියතුමා අවසන් හුස්ම හෙළන්නට පෙර ලංකාවට යාමේ අභිලාශයෙන් ගුවන් ටිකට් පතක් සූදානම් කරගන්නට මගේ මිතුරා යුහුසුලු වූයේ අපේද සහය ඇතිව ය. අවාසනාවකට ඔහුගේ ගමන් බලපත්‍රය ඒ වන විට අවලංගු වී තිබුණි. ලංකාවට යාම සඳහා අවශ්‍ය ගමන් ලියවිල්ලක් ලබාගන්නට මගේ මිතුරා මහා රාත්‍රියේ කැන්බරා බලා රිය පැදෙව්වේ ය. මගේ මිතුරා කැන්බරා තානාපති කාර්යාලයෙන් අවශ්‍ය ලියවිලි සකස් කරගෙන ආපසු මෙල්බන් කරා පැමිණියේ පසුදා රාත්‍රියේය. ඊළඟ දා ඔහු ලංකාවට යන විට ඔහුගේ පියා ඒයට පැය ගණනකට පෙර මෙළොව හැර ගොසි තිබුණි. අවශ්‍ය ගමන් ලියවිලි නිකුත් කරන්නට බලය ඇති කොන්සල් කාර්යාලයක් මෙල්බනයේ තිබුණා නම් මගේ මිතුරාට සිය පියා මියයන්නට පෙර ලංකාවට යන්නට හොඳටම අවකාශ තිබුණි.

මෙවන් අමිහිරි අත්දැකීම් වලට මුහුණ දුන් ශ්‍රී ලාංකිකයෝ වික්ටෝරියා ප්‍රාන්තයේ බොහෝ සිටිති. ඒ සැමගේම එකම ඉල්ලීම වී තිබුණේ අපට පූර්ණ බලතල සහිත කොන්සල් ජනරාල් කාර්යාලයක් ලබා දෙන්න යන්නයි. පූර්ණ බලතල සහිත කොන්සල් කාර්යාලයක් යනු වික්ටෝරියාවේ ශ්‍රී ලාංකික සමාජයට කාලයක සිට තිබුණ අවශ්‍යතාවකි.

හිටපු කොන්සල් රොඩ්නි අරම්බෙවෙල මහතා සහ කොන්සල් බන්දු දිසානායක මහතා තමාගේ කාලය ශ්‍රමය හා ධනය වැය කරමින් ශ්‍රී ලාංකික සමාජයට කළ මෙහෙය අපි අගය කරමු. නමුත් ඔවුන්ගේ ශක්තියෙන් වත් ධනයෙන් වත් කැපවීමෙන් වත් අපේ සමාජයට අවශ්‍ය බොහෝ සේවාවන් ඉටු කරන්නට නොහැකි වීම ඔවුන්ගේ වරදක් නොවේ. අවශ්‍ය බලතල නොමැති ගරු කොන්සල් තනතුරක් දැරූ බන්දු දිසානායක මහතාගෙන් යම් සේවාවක් සිදු වූයේ ඔහුගේ පුද්ගලික කැපවීම නිසා ය.

අපේ සමාජයට අවශ්‍යව තිබූ පූර්ණ බලැති කොන්සල් කාර්යාලයක් දැන් ලැබී ඇත. මේවාට පත්ව එන්නේ පවතින රජයට ආවඩන නිලධාරීන් බව රහසක් නොවේ. එසේම කල දුටු කල වල ඉහගන්නා තාලයේ පුද්ගලයින්ද මේ කාර්යාලය වටා රොක්වන්නටද ඉඩ ඇත. එසේ වූ පමණින් කොන්සල් ජනරාල් කාර්යාලයකින් අපේ සමාජයට ලබා ගත හැකි සේවාව අවතක්සේරු කිරීම සුදුසු නැතැයි මම සිතමි.

ලක්ෂයකට වැඩි ශ්‍රී ලාංකිකයෝ පිරිසක් වික්ටෝරියා ප්‍රාන්තයේ ජීවත් වෙති. ඕස්ට්‍රේලියා නම් වන මහා දේශයේ එක් ප්‍රාන්තයක් පමණක් වුවද වික්ටෝරියාවේ ජීවත් වන ශ්‍රී ලාංකිකයන්ට වඩා බොහෝ අඩු ශ්‍රී ලාංකිකයන් ජීවත්වන රටවල ශ්‍රී ලංකා තානාපති කාර්යාල පිහිටුවා ඇත්තේ ගණනින් අඩු වුවද ඒ පිරිසට සහය වන්නට ය. එසේ තිබියදී මේ සා විශාල පිරිසක් ජීවත් වන වික්ටෝරියා ප්‍රාන්තයට කොන්සල් ජනරාල් කාර්යාලයක් හෝ ලබා දීම අපි අගය කළ යුතු ය. ඒ සඳහා විශාල මුදලක් වැය වුවද ඒ මුදල වැය කරන්නේ ශ්‍රී ලංකා ප්‍රජාවගේ යහපත සඳහාය යන කාරණය අප අමතක කළ යුතු නැත. වැය කරන මුදලට සරිලන නිසි සේවය ලබා දීම ඒ නිලධාරීන්ගේ යුතුකමයි.

වික්ටෝරියාවේ කොන්සල් ජනරාල් කාර්යාලය තවම නිල වශයෙන් විවෘත කර නැත. මේ පත්ව ආ නිලධාරීන් තවම නිල වශයෙන් වැඩ කටයුතු ආරම්භ කර නැත. අපි බලා සිටිමු. මේ නිලධාරීන්ගෙන් අපේ සමාජයට අවශ්‍ය සේවය ඉටු වන්නේ දැයි අපි බලා සිටිමු. අපේ රටෙන් මේ සා විශාල මුදල් කන්දරාවක් වියදම් කරමින් පවත්වාගෙන යන කොන්සල් ජනරාල් කාර්යාලයෙන් අපට අවශ්‍ය සේවය සිදුවන්නේ නැත්නම් එදිනට අපි නැගී සිටිමු.

එතෙක් ඉවසිල්ලෙන් බලා සිටීම සුදුසු ය.




